ZEOM
කලාප අධ්‍යාපන කාර්යාලය - මීනුවන්ගොඩ
மண்டல கல்வி அலுவலகம் - மினுவாங்கொட
Zonal Education Office - Minuwangoda

සුවෙන් පෙරට

e ඉගෙනුම් පියස

මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

වාරය - 2

| | | |
|---|---|---|
| ශ්‍රේණිය : 10 | විෂයය : **ගෘහ ආර්ථික විද්‍යාව** | පාඩම : ඇඳුම් නිර්මාණය කිරීම<br>නිපුණතාව - 11<br>පුද්ගල අවශ්‍යතා සඳහා රෙදි වර්ග හඳුනාගෙන ඇඳුම් නිර්මාණය කරයි.<br>නිපුණතා මට්ටම - 11.1<br>ළදරු ඇඳුම් සඳහා උචිත රෙදි වර්ග තෝරා ගනියි. |

## ළදරු ඇඳුම් සඳහා රෙදි වර්ග හඳුනා ගනිමු.








පුද්ගල අවශ්‍යතා අනුව ඇඳුම් නිර්මාණයේදී ළදරු ඇඳුම් නිර්මාණය සුවිශේෂී වේ. ළදරු ඇඳුම් සඳහා උචිත රෙදි වර්ග හඳුනා ගැනීමට කෙඳි වර්ගීකරණය උදව් වෙයි.

**කෙඳි වර්ගීකරණය**

- ස්වභාවික කෙඳි
  - ශාකමය කෙඳි
    - කපු
    - ලිනන්
    - හණ
    - නියද
    - රැමි
  - සත්ත්වමය කෙඳි
    - සේද
    - ලෝම
  - ඛනිජමය කෙඳි
    - ඇස්බැස්ටස්
- මිනිසා විසින් නිෂ්පාදනය කරනු ලබන කෙඳි (කෘත්‍රිම)
  - අර්ධ කෘත්‍රිම රෙදි
    - විස්කෝස් රෙයොන්
    - ඇමෝනියම් රෙයොන්
    - සෙලියුලෝස් ඇසිටේට් රෙයොන්
    - නයිට්‍රෝ සෙලියුලෝස් රෙයොන්
  - කෘත්‍රිම රෙදි
    - පොලිටයිඩ් නයිලෝන්
    - පොලියෙස්ටර් ටෙරලින්
    - ඇක්‍රිලික් ඕර්ලෝන්
- වෙනත් කෙඳි
  - රන්
  - රිදී
  - වීදුරු







ඉහත කෙදි වර්ගීකරණයට අනුව ස්වාභාවික ශාකමය කෙදි වර්ගයක් වන කපු කෙදි පිළිබඳව හඳුනාගනිමු.

## කපු රෙදි හඳුනා ගැනීමේ සරල පරීක්ෂණ

**කපු රෙදි හඳුනා ගැනීමේ සරල පරීක්ෂණ**

- **අත ගා බැලීම**
  මතුපිට මෘදු, සිසිල් බවක් හා නොඇදෙන සුළු බවක් අතට දැනේ.

- **පුළුස්සා බැලීම**
  ගිනිදැල්ලට ළංකළවිට ක්‍රමයෙන් පිළිස්සේ. කහපාට දැල්ලක් සහිතය. කඩදාසි පිළිස්සෙන ගන්ධයක් දැනේ. ඉතිරිවන අළු සැහැල්ලු වන අතර, අළු පැහැතිය.

- **නූලක් කඩා බැලීම**
  ඇද්ද වහාම කැඩෙයි. කැඩුණු කෙළවර කෙදි කොටස් සිනිඳුය. බුරුසුවක මෙන් දැකිය හැකිය.

- **ජල අවශෝෂකතාව**
  ජල අවශෝෂකතාව ඉතා වැඩිය. ඉක්මනින් ජලය උරාගෙන තෙත් වේ.

ඉහත සඳහන් කෙඳිවල ගුණාංග අනුව ළදරු ඇඳුම් සඳහා කපු කෙඳිවලින් නිෂ්පාදිත රෙදිවර්ග වඩාත් සුදුසු වේ.

### කපුරෙදි ළදරු ඇඳුම් සඳහා යෝග්‍ය වීමට හේතු

- සිනිඳු බව හා මෘදු බවින් යුතුවීම.
- මනා අවශෝෂකතාවකින් යුක්ත වීම.
- නිතර සේදීමට හැකිවීම.
- සේදීමේදී හා මැදීමේදී ඉහළ උෂ්ණත්වයට ඔරොත්තු දීම.

### ළදරු ඇඳුම් සඳහා සුදුසු කපු රෙදි වර්ග

- මල් රෙදි
- වොයිල්
- නෙන්සුක්
- ලෝන්
- බැන්ඩේජ් රෙදි (නැප්කින්/හාන් රෙදි)

**ළදරු ඇඳුම් සඳහා කපු රෙදි තෝරා ගැනීමේදී ලා වර්ණ හා කුඩා මෝස්තර සහිත රෙදි වීම වැදගත්ය.**







ZEOM

කලාප අධ්‍යාපන කාර්යාලය - මිනුවන්ගොඩ
மண்டல கல்வி அலுவலகம் - மினுவாங்கொட
Zonal Education Office - Minuwangoda

සුවෙන් පෙරට

e ඉගෙනුම් පියස

මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

වාරය - 2

| ශ්‍රේණිය : 10 | විෂයය : **ගෘහ ආර්ථික විද්‍යාව** | පාඩම : ඇඳුම් නිර්මාණය කිරීම<br>නිපුණතාව - 11<br>පුද්ගල අවශ්‍යතා සඳහා රෙදි වර්ග හඳුනාගෙන ඇඳුම් නිර්මාණය කරයි.<br>නිපුණතා මට්ටම - 11.1<br>ළදරු ඇඳුම් සඳහා උචිත රෙදි වර්ග තෝරා ගනියි. |
|---|---|---|

## ඇගයීම

පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. කෙඳි වර්ගීකරණයට අනුව ස්වභාවික කෙඳි වර්ගකර දක්වන්න.
2. කෙඳි වර්ගීකරණයේ රන්, රිදී, වීදුරු කෙඳි අයත් කාණ්ඩය නම් කරන්න.
3. අර්ධ කෘත්‍රිම රෙයෝන් කෙඳි වර්ග සඳහා උදාහරණ 3ක් සපයන්න.
4. නයිලෝන්, ඇස්බැස්ටස්, ලිනන් යන කෙඳි වර්ග අයත් කාණ්ඩයන් අනුපිළිවෙලින් සඳහන් කරන්න.
5. කෙඳි වර්ගීකරණයේ කෘත්‍රිම කෙඳි හඳුන්වා, කෘත්‍රිම කෙඳි ප්‍රභේද 2 නම් කරන්න.
6. ජල අවශෝෂතාව ඉතාමත් වැඩි කෙඳි වර්ගය කුමක්ද?
7. i. කෙඳි හඳුනාගැනීමේ සරල පරීක්ෂණ 4ක් නම් කරන්න.

   ii. ඉන් පරීක්ෂණ 2ක් යටතේ කපු කෙඳි හඳුනා ගන්නා ආකාරය විස්තර කරන්න.
8. ළදරු ඇඳුම් සඳහා සුදුසු රෙදි වර්ග නම් කරන්න.
9. කපු රෙදි ළදරු ඇඳුම් මැසීම සඳහා යෝග්‍ය වීමට හේතු 4ක් සඳහන් කරන්න.

*(පෙළපොතේ පිටු අංක 150 සිට 152 දක්වා අධ්‍යයනය කර සකස් කරන ලදී)*


**සැකසුම සහ ඉදිරිපත් කිරීම :**

මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

**K.K.D. ප්‍රේමසුන්දර**

බප/මිනු නාවාන ම.වි

**N.P.K.G. නයිවලගේ**

බප/මිනු මුනිදාස කුමාරතුංග ක.වි.